**කම්කරු දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ මානව සම්පත් සංවර්ධන නිලධාරීන් සුවිශේෂී කාර්ය සාධනය යටතේ I ශ්‍රේණියට උසස් කිරීම**

01. 2010.06.16 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද හා 2013.05.07 දින සංශෝධනය කරන ලද කම්කරු දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ දැක්වෙන විධි විධාන පරිදි 2020.02.28 දින වන විට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති මානව සම්පත් සංවර්ධන නිලධාරී II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

02. I ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් හා උසස් කිරීමේ ක්‍රමය

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නිලධර ගණයේ II ශ්‍රේණියේ වසර නවය (9) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට නියමිත වැටුප් වර්ධක නවය උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර නවය (9) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (5) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

ඉහත සියලුම සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක්, 2010.06.16 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද හා 2013.05.07 දින සංශෝධනය කරන ලද කම්කරු දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ 10:2:2:2 හි සඳහන් පරිදි පවත්වනු ලබන අතර එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් 50% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා නිලධාරීන් II ශ්‍රේණියට උසස් වී වසර නවයක් (9)ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලැබේ.

03. සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් මේ සමඟ වන ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත ආයතන ප්‍රධානී මඟින් 2020.02.28 දින හෝ එදිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

ලිපිනය :- කම්කරු කොමසාරිස් (පාලන),<br>
කම්කරු දෙපාර්තමේන්තුව,<br>
තැ.පෙ.575,<br>
කොළඹ 05.

ඉල්ලුම්පත www.labourdept.gov.lk ඔස්සේ ලබා ගත හැකිය.